**විවෘත තරගකාරී ලංසුකරණය (OCB) ජාතික දැන්වීම්කරණය**

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය

**දිනය : 2024 මාර්තු 20**

**ණය/ ප්‍රදාන අංකය සහ ශීර්ෂය : ADB Grant G 9229-SRI**

**(ආහාර සුරක්ෂිතතා හා ජීවනෝපාය ප්‍රකෘතිමත් කිරීමේ හදිසි සහාය ව්‍යාපෘතිය)**

**කොන්ත්‍රාත් අංකය : MWCASE/PRO/ADB/OCB/NCB/SOLAR/GS-14**

**කොන්ත්‍රාත් ශීර්ෂය : වැඩිහිටි නිවාස සහ වෘත්තීය අභ්‍යාස ආයතන සඳහා සූර්යබල පියැසි මුදුන පීවී පද්ධති සැපයීම, ගෙනැවිත් භාරදීම, ස්ථාපනය, ක්‍රියාත්මක කරලීම හා නඩත්තුව.**

**ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන කාල සීමාව : 2024 අප්‍රේල් 22 ප.ව. 2.00**

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ආසියානු සංවර්ධන බැංකුව (ADB) වෙතින් ආහාර සුරක්ෂිතා හා ජීවනෝපාය ප්‍රකෘතිමත් කිරීමේ හදිසි සහාය ව්‍යාපෘතියේ පිරිවැය අරභයා මූල්‍ය පහසුකම් ලැබී ඇති අතර, එම ලැබීම් වලින් කොටසක් ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව යටතේ වන ගෙවීම් සඳහා යොදා ගැනීමට බලාපොරොත්තු වේ. ලංසුකරණය ADB ප්‍රභව යෝග්‍යතාපූර්ණ රටවල ලංසුකරුවන් සඳහා විවෘතය.

2. කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය ("ගැනුම්කරු") වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් "වැඩිහිටි නිවාස හා වෘත්තීය අභ්‍යාස ආයතන සඳහා සූර්යබල පියැසි මුදුන පීවී පද්ධති සැපයීම, ගෙනැවිත් භාරදීම, ස්ථාපනය, ක්‍රියාත්මක කරලීම හා නඩත්තුව සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. රටපුරා පිහිටි වැඩිහිටි නිවාස 41 ක් සහ වෘත්තීය අභ්‍යාස ආයතන (VTI) 9 ක් මෙම ව්‍යාපෘතිය යටතේ තෝරාගෙන ඇත. එක් එක් මධ්‍යස්ථානය සඳහා KW 2.2 සිට KW 20.0 දක්වා KW 325 ක එකතුවක් සහිතව සූර්යබල ධාරිතාවය වෙනස් වේ.

3. ADB හි තනි අදියර - තනි කවරය (ISIE) ක්‍රියා පටිපාටියට අනුකූලව විවෘත තරගකාරී ලංසුකරණය මෙහෙයවනු අතර, ලංසුකරණ ලිපිලේඛනවල විස්තර කොට ඇති පරිදි යෝග්‍යතාපූර්ණ රටවල සියලුම ලංසුකරුවන්ට විවෘතය.

4. ලංසුකරණ ලිපිලේඛනයන්හි පැහැදිලි කර ඇති පහත සඳහන් ප්‍රධාන සුදුසුකම් සහිත යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට පමණක් මෙම ලංසුකරණයට සහභාගී විය හැකිය.

**කොන්ත්‍රාත්තුමය පළපුරුද්ද**

පසුගිය වසර 5 තුළ සාර්ථකව හෝ ප්‍රමාණවත් ලෙස සම්පූර්ණ කළ සහ යෝජිත කොන්ත්‍රාත්තුවට සමාන. ලංසුකරුගේ සහභාගිත්වයේ වටිනාකම ශ්‍රී ලංකා රු. මිලියන 60 ඉක්මවන කොන්ත්‍රාත් අඩුතරමින් දෙකක් සාර්ථකව නිමා කර තිබීම. ලංසුකරුගේ සහභාගිත්වයේ සමාන බව, භෞතික ප්‍රමාණය, කාර්යයේ ස්වභාවය, සංකීර්ණතා ක්‍රමවේද, තාක්ෂණවේදය හෝ 6 වන වගන්තියේ (සේව්‍යයාගේ අවශ්‍යතාව) විස්තර කර ඇති පරිදි වෙනත් නෛසර්ගික ගති ලක්ෂණ මත පදනම් වනු ඇත.

- අඩු තරමින් ජාලක සම්බන්ධිත සූර්යබල ෆොටෝවෝල්ටික් බල උත්පාදන ව්‍යාපෘති 100 ක් වත් සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම හා ක්‍රියාත්මක කරලීම. ස්ථාපනය කළ එක් එක් ව්‍යාපෘතියේ ධාරිතාවය අඩු තරමින් KWP05 ක් හෝ ඊට වැඩි විය යුතුය. පසුගිය වසර තුන (03) තුළ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සියල්ලෙහි ධාරිතාව KW1000 ක් හෝ ඊට වැඩි විය යුතුය. සම්පූර්ණ කළ ව්‍යාපෘතිවල විස්තර ඇතුළත් කරන්න. අවශ්‍ය වන පරිදි අමතර පිටු අමුණන්න. ලංසුකරු ව්‍යාපෘති තුනක් (03) සඳහා පාරිභෝගික ගිවිසුම් සහ උපයෝගිතාව සමග ශුද්ධ මාපක ලියැවිලි පිටපත් තුනක් (03) ඉදිරිපත් කළ යුතුය.

**ඓතිහාසික මූල්‍යමය කාර්යසාධනය**

- පසුගිය වසර සඳහා සම්පූර්ණ වත්කම් හා සම්පූර්ණ වගකීම් අතර වෙනස ලෙස ගණනය කළ ලංසුකරුගේ ශුද්ධ අගය අවම්යක් ලෙස ධනාත්මක විය යුතුය.
- පසුගිය වසර 3 පුරාවට සම්පූර්ණ කළ හෝ ක්‍රියාත්මක වෙමින් පවතින කොන්ත්‍රාත් සඳහා ලැබූ ගෙවීම්වල එකතුව ලෙස ගණනය කළ අවම පිරිවැටුම් සාමාන්‍යය ශ්‍රී ලංකා රු. මිලියන 160 කි.
- ශ්‍රීලංරු. මිලියන 40 ක් වන මුදල් සංචරණය සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීල වත්කම් වෙත ප්‍රවේශය ණය මාර්ග සහ වෙනත් මූල්‍ය සැපයුම් හි සුලභතාව හෝ ප්‍රවේශය

5. වැඩිදුර තොරතුරු ලබාගැනීමටත් ලංසුකරණය ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් පහත සඳහන් අය සම්බන්ධ කරගත යුතුය. ශ්‍රී ලංකාව, බත්තරමුල්ල, "සෙත්සිරිපාය", අදියර 2, 5 වන මහල, (වින්ග් A), කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී - දුරකථන අංක +94112187253 හෝ ෆැක්ස් අංක +9411-2187255 (ඊමේල් : adbproject.mwca@gmail.com) ලංසුකරණ ලිපිලේඛන එම කාර්යාලයේදීම ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකිය. ලංසුකරණ ලිපිලේඛන http://www.childwomenmin.gov.lk/ වෙබ් පිටුවට පිවිසීමෙන් ලබාගත හැකිය.

6. ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන මිලදී ගැනීමට ලංසුකරුවන්;
   - ඉහත ලිපිනයට ලංසුකරණ ලිපිලේඛන ඉල්ලා ශ්‍රී ලංකාව, බත්තරමුල්ල, සෙත්සිරිපාය, අදියර 2, 5 වන මහල, (වින්ග් A) කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය, ආහාර සුරක්ෂිතතා සහ ජීවනෝපාය ප්‍රකෘතිමත් කිරීමේ හදිසි සහාය ව්‍යාපෘතියේ, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලිපියක් ඉදිරිපත් කිරීම.
   - 2024 මාර්තු 20 දින සිට 2024 අප්‍රේල් 19 දින තෙක් සාමාන්‍ය කාර්යාල දිනයන්හි 09.00 පැය සිට 15.00 පැය දක්වා රු. 12,500.00 ක ආපසු නොගෙවන ගාස්තුවක් මුදලින් හෝ කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම් නමට ලබාගත් බැංකු අණකරයක් මගින් ගෙවිය යුතුය.
   - ලිපිලේඛන අතින් ගෙනැවිත් දිය යුතුය. නැතිවීම් හෝ ප්‍රමාදව ගෙනැවිත් භාරදීම් පිළිබඳව වගකියනු නොලැබේ.

7. ඔබේ ලංසු;
   - "ශ්‍රී ලංකාව, බත්තරමුල්ල, "සෙත්සිරිපාය" අදියර 2, 5 වන මහල (වින්ග් A) ප්‍රසම්පාදන අංශයේ, කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති" වෙත
   - 2024 අප්‍රේල් 22 ලංසු භාරගැනීමේ අවසාන දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර
   - ලංසුකරණ ලිපිලේඛනයන්හි විස්තර කොට ඇති පරිදි ශ්‍රීලංරු. 1,500,000/- වටිනාකමැති ලංසු සුරක්ෂණයක් හා සමග ගෙනැවිත් භාරදිය යුතුය.

   ලංසු භාර ගැනීමේ අවසාන වේලාව ඉකුත් වූ වහාම, එම අවස්ථාවට සහභාගී වීමට බලාපොරොත්තු වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කරනු ලැබේ.

8. ලංසු සංසන්දනය කිරීමේදී දේශීය ප්‍රමුඛතාව අදාළ නොවනු ඇත.

9. ශ්‍රී ලංකාව, බත්තරමුල්ල, "සෙත්සිරිපාය" අදියර 2, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ සම්මන්ත්‍රණ කාමරයේදී 2024 අප්‍රේල් 04 දින 11.00 පැයට පූර්ව - ලංසු රැස්වීමක් පැවැත්වීමට නියමිතය. අභිලාෂී ලංසුකරුවන්ට තමන්ගේම වියදමෙන් පූර්ව ලංසු රැස්වීමට සහභාගී විය හැකිය.

10. ලංසු පිළියෙළ කිරීමෙහි හා ඉදිරිපත් කිරීමෙහිලා සම්බන්ධ සියලු පිරිවැය ලංසුකරු විසින් දැරිය යුතු අතර, ලංසුකරණ ක්‍රියාදාමයේ මෙහෙයවීම හා ප්‍රතිඵල කුමක් වුවද එම පිරිවැය පිළිබඳව සේව්‍යයා වගකියනු නොලැබේ.